**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**ශාස්ත්‍ර පීඨය**
**ශාස්ත්‍රවේදී අධ්‍යයන ධාරා පරීක්ෂණය - පළමු භාගය**
**දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය - (2018/19)**

## GYG 2236 – පාරිසරික උපද්‍රව

**කාලය පැ. 02 යි**

ප්‍රශ්න **තුනකට (03)** ට පමණක් පිළිතුරු සපයන්න.

---

**01.** (i) "ආපදාවන්ට ගොදුරු විය හැකි බව" (Disaster vulnerability) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? **(ලකුණු 03)**

(ii) ස්වාභාවික උපද්‍රවයක ප්‍රබල බව (severity) තීරණය කරන සාධක හයක් 06 ක් නම් කරන්න. **(ලකුණු 03)**

(iii) ඉහත ප්‍රශ්න අංක 1.ii හි සඳහන් කරන ලද සාධක තුනක් (03) ඇසුරින් ගංවතුරක සහ භූමිකම්පාවක ප්‍රබල බව (severity) වෙනස් වන ආකාරය සංසන්දනය කරන්න. **(ලකුණු 06)**

(iv) ස්වාභාවික උපද්‍රවයන්හි ප්‍රබල බව (severity) තීව්‍ර වීම කෙරෙහි මානව මැදිහත් වීම් බලපාන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. **(ලකුණු 08)**

**(මුළු ලකුණු 20)**

**02.** (i) නායයෑම් වර්ගීකරණය කරන්න. **(ලකුණු 03)**

(ii) ඉහත ප්‍රශ්න අංක 2.i ට අදාළව නායයෑම් වර්ගීකරණය සඳහා පාදක කරගත් නිර්ණායක මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 03)**

(iii) අදාළ කටු සටහන් යොදා ගනිමින් නායයෑම් වර්ග දෙකක් සංසන්දනය කරන්න. **(ලකුණු 06)**

(iv) නායයාමක බලපෑම් අවම කිරීම සඳහා නායයෑම් පූර්ව ලක්ෂණ යොදා ගැනීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. **(ලකුණු 08)**

**(මුළු ලකුණු 20)**

**03.** (i) නියඟයේ බලපෑමට නිරන්තරයෙන් ලක්වන දිස්ත්‍රික්ක හතරක් (04) නම්කරන්න. **(ලකුණු 02)**

(ii) ඉහත සඳහන් කළ ප්‍රදේශ නියඟයේ බලපෑමට නිරන්තරයෙන් ගොදුරු වන්නේ ඇයි දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 04)**

(iii) දියුණුවෙමින් පවතින රටවල් කෙරෙහි නියඟය මගින් ඇති කරනු ලබන බලපෑම් සාකච්ඡා කරන්න. **(ලකුණු 06)**

(iv) නියඟයේ බලපෑම් අවම කර ගැනීම සඳහා දියුණු වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විමසන්න. **(ලකුණු 08)**

**(මුළු ලකුණු 20)**

**04.** (i) "ආපදා කළමනාකරණය" යන්න ඔබ විස්තර කරනුයේ කෙසේද?

**(ලකුණු 03)**

(ii) සුදුසු රූපසටහනක් භාවිත කරමින් ආපදා කළමනාකරණයේ අවස්ථා කෙටියෙන් දක්වන්න. **(ලකුණු 04)**

(iii) ආපදා අවම කිරීමේ ව්‍යුහාත්මක සහ ව්‍යුහාත්මක නොවන ක්‍රමවේද ලැයිස්තු ගත කරන්න. **(ලකුණු 05)**

(iv) පූර්ව සහ පශ්චාත් ආපදා කළමනාකරණයේ දී ප්‍රජාවගේ කාර්යභාරය සාකච්ඡා කරන්න. **(ලකුණු 08)**

**(මුළු ලකුණු 20)**

**05.** (i) ජෛව විද්‍යාත්මක ව්‍යසනයන්හි දී ධාරකයා (Host), රෝග බීජය (Pathogen) සහ පරිසරය (Environment) යන්න නිර්වචනය කරන්න. **(ලකුණු 03)**

(ii) රෝග වාහකයන් මගින් පැතිරෙන රෝග (Vector-borne diseases) යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? **(ලකුණු 04)**

(iii) රෝග වාහකයන් මගින් පැතිරෙන රෝග ව්‍යාප්ත වීම සඳහා වඩාත්ම බලපාන සාධක කෙටියෙන් පහදන්න. **(ලකුණු 05)**

(iv) "රෝග වාහකයන් මගින් පැතිරෙන රෝග වඩාත් සංකීර්ණ වේ". ඔබ මෙම කියමන සමග එකඟ වන්නේද? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

**(ලකුණු 08)**

**(මුළු ලකුණු 20)**

**06.** පහත සඳහන් ඕනෑම මාතෘකා <u>දෙකක් (02)</u> සඳහා කෙටි විස්තර සපයන්න.

(i). ආපදා කළමනාකරණයේ දී ආකල්පමය වෙනස

(ii). පාංශු ඛාදනය සඳහා බලපාන ප්‍රධාන හේතු

(iii). බෝවන රෝග ආදර්ශකය (Infectious disease model)

(iv). ශ්‍රී ලංකාවේ මාර්ග අනතුරු ප්‍රවණතා

**(මුළු ලකුණු 10*2 = 20)**